ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක
කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 42,76 හා 99 ඡේදයන්ට පටහැනිව 2023 මාර්තු 07 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා මුද්‍රණාල ආදායම වූ රු.18,504,114 ක්, මුද්‍රණාල වියදම වූ රු.8,433,158 ක්, 2023 වර්ෂයේ අවසන් දිනට රු.4,497,917 ක් වූ ණයගැති වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ගළපා නොමැතිබවට පෙර වර්ෂයේ විගණනයේදී පෙන්වා දී තිබුණ ද, ප්‍රවර්තන වර්ෂයේ එයට අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබීම නිසා සමුච්චිත අලාභය රු. 10,070,956 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද, මෙම ගැලපීම් සමාලෝචිත වර්ෂයේදී ද සිදු කර නොතිබූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මුද්‍රණාල ආදායම රු.19,105,758 ක්, මුද්‍රණාල වියදම රු.15,558,566 ක්, සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.5,656,580 ක් වූ අවසන් තොගය සහ බැංකු ප්‍රකාශනය අනුව රු.813,419 ක ශේෂයක් මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අලාභය රු.3,547,192 ක් වැඩියෙන් ද, ජංගම වත්කම් රු.10,967,913 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.	2023 මාර්තු 07 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මුද්‍රණාලය ස්වාධීන ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට අනුමැතිය ලද බැවින් මුද්‍රණාලය ස්වාධීන ඒකකයක් ලෙස ගිණුම් පිළියෙල කරනු ලබයි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුකූලව සියළු ආදායම්,වියදම් හා වත්කම් ගිණුම්ගත කර වර්ෂයේ අතිරික්තය හෝ ඌණතාවය ගණන්බැලිය යුතු වීම.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 48 ඡේදය අනුව වත්කම් හා වගකීම් හිලව් කර දැක්වීම සිදු නොකල යුතු නමුත් මූල්‍ය ප්‍රකාශන තුල ණයගැතියන් නිරූපනයේදී රු.37,091,230 ක් වූ බැර ශේෂයන් ණයගැති වටිනාකමින් අඩුකර තිබූ අතර, ඒ අනුව එම වටිනාකමින් මූල්‍ය ප්‍රකාශන තුල වත්කම් හා වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.	මාසය අවසන් වන තෙක්ම තැන්පතුපත රැගෙන විත් රිසිට්පත ලබා නොගත් තැන්පතු බැංකු සැසඳුම් පත්‍රය පිළයෙල කිරීමට පෙර Course Fee Receivable-General ලෙජර් ගිණුමට බැර කර මුදල් පොතට ලැබීමක් ලෙස සටහන් කරනු ලැබේ. අදාල සිසුන්ව නිවැරදිවම හඳුනා ගෙන නැතත් ලැබිය යුතු පාඨමාලා ගාස්තු ගිණුමෙන් අඩු විය යුතු	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව වත්කම් හා වගකීම් මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කළ යුතු වීම.

		වටිනාකමක් බැවින් ණයගැති ශේෂය අඩු කර දක්වා ඇත.	
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 13 ඡේදයට පටහැනිව විශ්වවිද්‍යාලය විසින් උපාධි ප්‍රධානෝත්සව සඳහා භාවිතා කරන උපාධි කබා සහ ඊට අදාල අයිතමයන් දේපළ, පිරියත හා උපකරණ යටතේ හඳුනා ගත යුතු වුවද, රු.19,482,345 ක් වටිනා උපාධි කබා සහ අනෙකුත් අයිතම නිල ඇඳුම් සහ රෙදිපිළි ලෙස තොග යටතේ දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල තොග වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් සහ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	විගණන විමසුම හා එකඟ වෙමි. ඉදිරියේ දී ස්ථාවර වත්කමක් ලෙස හඳුනා ගෙන ක්ෂය හඳුනා ගැනීමට සටහන් කර ගතිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කළ යුතුය.
(ඈ)	ඉහත (ඇ) ඡේදයට අදාළව ප්‍රමිතියේ 64 ඡෙදය ප්‍රකාරව වත්කමක ක්ෂය කල හැකි අගය ප්‍රයෝජනවත් ජීවිත කාලය මුළුල්ලේ ක්‍රමාණුකූල පදනමක් මත බෙදාහල යුතු නමුත් උපාධි කබා සහ ඊට අදාළ අයිතම, තොගය ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය අඩුවෙන් දක්වා තිබූ අතර එම අලාභය විගණනයේදී ගණනය කළ නොහැකි විය.	විගණන විමසුම හා එකඟ වෙමි. ඉදිරියේ දී ස්ථාවර වත්කමක් ලෙස හඳුනා ගෙන ක්ෂය හඳුනා ගැනීමට සටහන් කර ගතිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ක්ෂය ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කළ යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 14 ඡේදයට පටහැනිව 2022 සැප්තැම්බර් 19 දින සිට එන්ඩස්කොපි අංශය විසින් උපකරණ කට්ටලය භාවිතය සඳහා යොදා ගෙන තිබියදී වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂ තුල දැක්වීම හේතුවෙන් රු.24,723,156 කින් ස්ථාවර වත්කම් අඩුවෙන් සහ ජංගම වත්කම් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද, 2022, 2023, 2024 වර්ෂ සඳහා එම වත්කම් ක්ෂය නොකිරීම හේතුවෙන් වර්ෂයේ අලාභය රු. 2,472,316 කින් අඩුවෙන් හා සමුච්චිත අලාභ රු. 3,169,982 කින් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි.	සියළුම වත්කම් ක්ෂය කිරීම භාණ්ඩ ලැබීමේ සටහන නිකුත් කර ඇති දිනය පදනම් කරගෙන සිදු කරන බැවින් මෙම උපකරණය සඳහා ක්ෂය ගණනය කරනු ලබන්නේ 2023.06.06 දින සිටය. එබැවින් වත්කම් ක්ෂය නොකිරීම හේතුවෙන් වර්ෂයේ අලාභය රු.2,472,316 යන නිරීක්ෂණය සමග එකඟ වන අතර සමුච්චිත ලාභය රු.3,169,982 කින් අඩු වී ඇත යන නිරීක්ෂණය සමඟ එකඟ විය නොහැක.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ස්ථාවර වත්කම් හඳුනාගැනීම, ගිණුම්ගත කිරීම හා ක්ෂය කිරීම ඉදිරියේදී සිදු කළ යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 14 ඡේදයට පටහැනිව නාරි හා ප්‍රසවවේද ශල්‍යකර්ම සඳහා වූ ශල්‍යකර්ම කට්ටල පිරිවැය වූ රු.7,845,381 ක් වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂ තුල දැක්වීමෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් සහ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද, මෙම අයිතමයන්	ඉදිරියේ දී මෙම ගැටළු නිරාකරණය කර අදාල වටිනාකම වත්කමක් ලෙස හඳුනා ගැනීමට ඉදිරි කටයුතු කිරීමට සටහන් කර ගතිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට

	සඳහා 2019 ජුනි සිට 2024 දක්වා ක්ෂය නොකිරීම හේතුවෙන් 2024 වර්ෂයේ අලාභය රු.784,538 කින් අඩුවෙන් හා සමුච්චිත අලාභ රු.3,557,289 කින් අඩුවෙන් දක්වා තිබුණි.		හා ක්ෂය ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කළ යුතුය.
(උ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 38 ඡේදයට පටහැනිව තොගය තුල ඇතුලත් වූ රු.22,858,871 ක් වටිනා ටෝනර් සහ කාට්‍රිජ් තුල 2015 සහ 2016 වර්ෂවල මිලදී ගෙන නිකුත් නොවී පවතින රු.3,600,465 ක තොග පැවති අතර, ඒ සඳහා වෙන් කිරීම් නොකිරීම නිසා වර්ෂයේ අලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබූ අතර විශ්වවිද්‍යාල රෝහලෙහි රු.2,936,288 ක් වටිනා Rapid Antigen සහ PCR කට්ටල 2,725 ක් හා රු.16,441,056 ක් වටිනා ඖෂධ හා එන්නත් ඒකක 363,012 ක් කල් ඉකුත් වී තිබූ අතර, ඒ සඳහා වෙන් කිරීම් කිරීමට කටයුතු කර නොතිබීම මත වර්ෂයේ අලාභය එම වටිනාකම්වලින් අඩුවෙන් දක්වා තිබුණි.	විගණන විමසුම හා එකඟ වෙමි. ඉදිරියේදී අදාළ තොග වෙන් වෙන් වශයෙන් තබාගැනීමට කටයුතු කරනු ලබයි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කල් ඉකුත් වූ තොග සඳහා වෙන්කිරීම් කිරීමට ඉදිරියේදී කටයුතු කළ යුතු වීම.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විශ්වවිද්‍යාල ශ්‍රවනාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ සවිකළ යුතු රු.84,848,400 ක වටිනාකමකින් යුතු පුටු 1,275 ක් මිලදී ගෙන තිබුණි. එම මිලදී ගැනීම සඳහා 2023 ජුනි 07 දින රු.29,272,698 (VAT සහිත) ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. ඊට අදාළව අන්තර් කාලීන ගෙවීම් ලෙස අවස්ථා 2 කදී රු.60,794,261 ක් ගෙවා තිබුණි. ඒ අනුව එම පුටු 2023 නොවැම්බර් 14 දින විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබුණි. නමුත් මෙම මිලදී ගැනීමට අදාළව ගෙවා තිබූ අත්තිකාරම් මුදල මූල්‍ය ප්‍රකාශන තුල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (Mobilization Advance) ලෙස සමාලෝචිත වර්ෂය අවසන්වන විටද දක්වා තිබීමෙන් ජංගම වත්කම් රු.29,272,698 ක් වැඩියෙන් සහ ජංගම නොවන වත්කම් යටතේ කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගිණුම් ගත කර තිබෙන රු.29,272,698 ක වටිනාකම කෙරී ගෙන යන වැඩ ගිණුමට මාරු කර නිවැරදි කිරීමට සටහන් කර ගත් අතර මෙම මුළු වටිනාකමට අදාල පුටු ශ්‍රවණාගාර ගොඩනැගිල්ල තුළ සවි කිරීමෙන් පසු ස්ථාවර වත්කම් ලෙස හඳුනාගැනීමට ඉදිරියේ දී කටයුතු කෙරේ.	කෙරීගෙන යන වැඩ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම.
(ආ)	ඉකුත් වර්ෂයන්ට අදාලව ලැබිය යුතු ලොන්ඩ්‍රි ආදායම රු.5,349,465 කින් වැඩියෙන් ද, සමාලෝචිත වර්ෂයේ ලොන්ඩ්‍රි ආදායම සහ ලැබිය යුතු ලොන්ඩ්‍රි ආදායම රු.803,925 කින් වැඩියෙන් ද දක්වා තිබුණි.	වැරදි නිවැරදි කිරීමට හා නිරවුල් නොවූ ශේෂ නිරවුල් කර ගැනීමටත් සටහන් කර ගතිමි.	ආදායම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කල යුතු වීම.

(ඇ) තොග පද්ධතියේ විශ්වාසනීයත්වය තහවුරු කර ගැනීම සඳහා කළමනාකරණය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පදනම් කර ගෙන අවම වශයෙන් වසරකට වරක්වත් තොග ආගණනය කල යුතු වුවත්, ඒ පිළිබඳ විගණක විසින් ඉල්ලා සිටින ලද තොග ආගණන පත්‍රිකා ලබා නොදීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් රු.224,362,977 ක් වූ තොගය පිළිබඳ විශ්වාසනීයත්වය හා නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය.	අදාල වාර්තාවල තොග තොරතුරු කවර මූලාශ්‍රයකින් ලබාගත්තේද යන්න සහ එහි විශ්වාසනීයත්වය තහවුරු කරනු ලැබූයේ කෙසේද යන්න මූල්‍යාධිකාරී කාර්‍යාලයෙන් තොරතුරු විමසීමක් කිරීම සුදුසු බව හැඟේ.	තොග වටිනාකමේ නිරවද්‍යතාව තහවුරු කර ගැනීමට තොග ආගණනයක් සිදු කළ යුතු වීම.
(ඈ) 2022 වර්ෂයේ බැර ශේෂයක් ලෙස දක්වා තිබූ ගැණුම් අත්තිකාරම් රු.709,820 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද ගිණුම් වලට ගලපා නොතිබූ අතර දක්ෂිණ මණ්ඩපයේ සමාලෝචිත වර්ෂය අවසන් දිනට නොපිය වූ අත්තිකාරම් සම්බන්ධයෙන් ලබාදුන් විස්තරාත්මක උපලේඛනය අනුව රු.677,563 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකශන අනුව එය රු.1,763,601 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු.1,086,038 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ලෙජරය සහ උපලේඛනය පරීක්ෂා කර අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට සටහන් කර ගතිමි.	නිවැරදි අත්තිකාරම් වටිනාකම් ගිණුම්වල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම.

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

අයිතමය	වටිනාකම රු.	නොලද සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වියදම්	5,000,000	ගෙවීම් වවුචර	ඒ සම්බන්ධව අභ්‍යන්තර පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.	විගණනය සඳහා වවුචර් ඉදිරිපත් කළ යුතු වීම.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වෙනත් ලැබිය යුතු ශේෂය තුල ඇතුළත් සුභ සාධක අරමුදලට 2022 වර්ෂයේ ලබාදී තිබූ රු.331,000 ක් 2024 වර්ෂය අවසන් වන විටද අයකර ගෙන නොතිබුණි.තවද රු.12,070,570 ක ලැබිය යුතු කුලී ආදායම් තුල රු.6,000,000 ක් වූ කුලී ආදායම KDU Hotel ආයතනයෙන් ලැබිය යුතුව තිබුණි.එමෙන්ම විදුලිය හා ජලය සැපයීම වෙනුවෙන් සැලසුම් හා සංවර්ධන මූල්‍ය ආයතනයෙන්, විශ්වවිද්‍යාල රෝහලෙන් සහ ලෝක ආහාර වැඩසටහනෙන් අයවිය යුතු රු.5,314,450 ක මුදලක් අයකරගෙන නොගෙන වර්ෂ 01 ත් 04 ත් අතර කාලයක් ගත වී තිබුණු	නැවත අයකරගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. නීතිමය කටයුතු සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ.	ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.

අතර විශ්වවිද්‍යාල සිසුන්, ස්ථිර සේවකයින් සහ කැඩෙට් නිලධරයන්ගෙන් බැඳුම්කර උල්ලංඝණය කිරීම හේතුවෙන් ලැබිය යුතු රු.119,467,611 ක් අයකර ගැනීමට අපොහොසත්ව වර්ෂ 2 ත් 5 ත් අතර කාලයක් ගත වී තිබුණි.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 12.2.5 වගන්තිය**	රාජකාරී ආවරණය කරන විශ්වවිද්‍යාලයේ 644 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී, මිලෝදා ආයතනයේ ගණකාධිකාරී තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා 2022 ජූලි මස 01 දින පත්කර, රාජකාරී ආවරණය සඳහා ගණකාධිකාරී මූලික වැටුපෙන් සියයට 25 ක දීමනාවක් ගෙවීමටද අනුමත කර තිබුණි. 2022 සැප්තැම්බර් 13 දින සිට මිලෝදා ආයතනය සඳහා සහකාර මූල්‍යාධිකාරීවරයෙකු ද පත්කර තිබියදී 2022 ඔක්තෝබර් සිට 2023 ඔක්තෝබර් දක්වා රාජකාරී ආවරණ දීමනා ලෙස රු.452,238 ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	2022.09.13 දින හමුදාව මඟින් අනුයුක්ත කළ නිලධාරියා සතියකට දින 03 ක් පමණක් මෙට්‍රොපොලිටන් ආයතනයේ සේවයේ යෙදීමත්, එම නිලධාරියාගේ පළපුරුද්ද අවම වීම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ සුදුසුකම් සහ අත්දැකීම් පරිපූර්ණ මූල්‍යාධිකාරී, මෙට්‍රොපොලිටන් කැම්පස් අධ්‍යයන ආයතනයේ ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීමට පත් කර ඇත.	ආයතන සංග්‍රහයට අනුකූල විය යුතු වීම.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**			
(i)	මුදල් රෙගුලාසි 200, 128, 103 සිට 108	උක්ත මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ මුදල් වැය කිරීම,මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සහ වැරදි හෝ වංචා සම්බන්ධ ක්‍රියාකිරීම ඇතුළු කටයුතුවලදී ප්‍රමාණවත් විධි විධාන යෙදීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරයාගේ වගකීම වන්නේය. තවද, 1988 නොවැම්බර් 11 වැනි දින නිකුත් කරන ලද සර් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන රෙගුලාසි 8 අනුව කළමනාකරණ මණ්ඩලය විසින් පත්කරන ලද ගණකාධිකාරීවරයා රජයේ මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතු බවද දක්වා තිබුණි. එසේ තිබියදී 2023 මාර්තු 08 දින මුද්‍රණාලය ස්වාධීන ආයතනයක් ලෙස	නියෝජ්‍ය උපකුලපතිගේ (ආරක්ෂක හා පාලන) ප්‍රධානත්වයෙන් සමන්විත මණ්ඩලයක් මගින් පාලනය කිරීම සඳහාත්, මුද්‍රණාලය ස්වාධීන ආයතනයක් ලෙස පවත්වා ගෙන යාමට හා රුපියල් මිලියන 5ක ණය මුදලක් ලබා දීමට 2023 මාර්තු 07 දින පැවති අධ්‍යක්ෂක මණඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දී ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව මුද්‍රණාලයස ම්බන්ධ වගකීම ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම.

		කටයුතු කිරීමට කළමනාකරණ මණ්ඩලය ලබා දී තිබුණු අනුමැතිය හේතුවෙන් සහ වවුචර් අංක 954-G මගින් 2023 මාර්තු 13 දින රු.5,000,000 ක් මුද්‍රණාලයට ලබා දී තිබීමෙන් මුදල් රෙගුලාසිවලට පටහැනිව කටයුතු කිරීමට අනුබල දීමක් සිදු වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.		
(ii)	මුදල් රෙගුලාසි 384 සිට 386	චෙක්පත් රේඛනය කර තිබිය යුතු අතර විවෘත චෙක්පත් නිකුත් නොකල යුතු නමුත් මුද්‍රණාලය විසින් අංක 31951 සිට 31975 දක්වා වූ චෙක් පොතෙහි චෙක්පත් 24 ක් මුදල් චෙක් ලෙස නිකුත් කර තිබූ අතර, එම චෙක්පත් 24 හි වටිනාකම රු.5,516,486 ක් විය. තවද, ඉහත සඳහන් චෙක්පත්වලට අමතරව බැංකු ප්‍රකාශන අනුව 2023 වර්ෂයේ ජූලි සිට ඔක්තෝබර් දක්වා රු.3,760,843 ක් වටිනා චෙක්පත් 35 ක්ද, මුදල් චෙක්පත් ලෙස නිකුත් කර තිබුණි.	මුද්‍රණාලයෙහි අධීක්ෂණ කටයුතු සිදුකල නිලධාරි විසින් ඒ ඒ මුද්‍රණ කටයුතු සඳහා ලිඛිතව ඉල්ලුම් කරන ලද අමුද්‍රවයන් හා සේවාවන් සඳහා පමනක් කොආවි මුද්‍රණාලය වෙත බඳවා ගත් මෙහෙයුම් කලමනාකරු වෙත එම මුදල් නිසි අයුරින් ලබාදී ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව චෙක්පත් නිකුත් කිරීමේදී කටයුතු කළ යුතු වීම.
(iii)	මුදල් රෙගුලාසි 139(6)	චෙක්පතකින් ගෙවීම්කරන කල්හි ආදායකයාගේ නාමය වවුචරයේ ඇති විස්තර සමඟ ගැළපිය යුතු වුවත් මුද්‍රණාලය විසින් විගණනයට ලබාදුන් ඉන්වොයිසි සඳහා ගෙවීම් කිරීමේදී එම ඉන්වොයිසියේ සඳහන් පුද්ගලයාගේ නමට චෙක්පත් නිකුත් කර නොතිබූ අතර චෙක්පත් ලිවීමේදී චෙක්පත්වලට අත්සන් කරන “Officer In Charge” නිලධාරියා විසින් මෙම මුදල් චෙක්පත්වලින් රු.1,538,945 ක් වූ චෙක්පත් 8 ක් සිය නමට ලියා මුදල් චෙක්පත් නිකුත් කර තිබුණි.	මුද්‍රණාලයෙහි අධීක්ෂණ කටයුතු සිදුකල නිලධාරි විසින් ඒ ඒ මුද්‍රණ කටයුතු සඳහා ලිඛිතව ඉල්ලුම් කරන ලද අමුද්‍රවයන් හා සේවාවන් සඳහා පමනක් කොආවි මුද්‍රණාලය වෙත බඳවා ගත් මෙහෙයුම් කලමනාකරු වෙත එම මුදල් නිසි අයුරින් ලබාදී ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව චෙක්පත් ලිවීමේදී කටයුතු කළ යුතු වීම.
(iv)	මුදල් රෙගුලාසි 257 සහ මුදල් රෙගුලාසි 225	මුදල් රෙගුලාසි 257 ප්‍රකාරව සහතික කළ වවුචර් සඳහා පමණක් ගෙවීම් කළ යුතු අතර, සහතික නොකරන ලද වවුචරයකට මුදල් ගෙවීම් බල රහිත ගෙවීමක් ලෙස සැලකෙන අතර, එසේ ගෙවනු ලබන මුදල ඒ ගැන වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීමට කටයුතු කළ යුතු අතර නියමිත ආකෘති පත්‍රවල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පුරවා පිළියෙල කරන ලද වවුචර් සියළු ගෙවීම් සඳහා ඉදිරිපත් කල යුතු නමුත් මුද්‍රණාලයේ ගෙවීම් සඳහා වවුචර් පිළියෙල කර සහතික කරන ලද වවුචර් මත ගෙවීම් කර නොතිබුණි.	සියලුම මුද්‍රණ කටයුතු සඳහා වන වවුචර් මුද්‍රණාල නිලධාරි අණදෙනගේ නිර්දේශයෙන් හා උපකුලපතිගේ අනුමැතියෙන් පසුව එම අමුද්‍රව්‍යා වටිනාකමට සරිලන චෙක්පතක් මුදල් කර මෙහෙයුම් කලමනාකරු වෙත මුදල් ලබාදී ඇවැසි අමුද්‍රව්‍යා හා සේවාවන් මිලදී ගැනීම සිදුකර ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව සහතික කළ වවුචර් සඳහා පමණක් කටයුතු කළ යුතු වීම.

(v)	මුදල් රෙගුලාසි 272	ගෙවූ සියළුම වවුචර් ඒවායේ අනුක්‍රමික අංක අනුව පිළියෙල කොට ආරක්ෂා සහිතව තබාගත යුතු අතර, විගණනය සඳහා අවශ්‍ය කරුණු සම්පූර්ණ කොට සූදානම් කර තැබීමට වගබලා ගත යුතු වුවත්, වාර්තාවේ දින වන විටත් ගෙවීම් වවුචර් ඉදිරිපත් කිරීමට මුද්‍රණාලය අපොහොසත් වී තිබුණි.	සියලුම මුද්‍රණ කටයුතු සඳහා වන වවුචර් මුද්‍රණාල නිලධාරි අණදෙනගේ නිර්දේශයෙන් හා උපකුලපතිගේ අනුමැතියෙන් පසුව එම අමුද්‍රව්‍ය වටිනාකමට සරිලන චෙක්පතක් මුදල් කර මෙහෙයුම් කලමනාකරු වෙත මුදල් ලබාදී ඇවැසි අමුද්‍රව්‍ය හා සේවාවන් මිලදී ගැනීම සිදුකර ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව විගණනය සඳහා වවුචර් ඉදිරිපත් කළ යුතු වීම.
(vi)	මුදල් රෙගුලාසි 262(2)	ගෙවන ලද සියලුම වවුචරවල සහ ඒවා තහවුරු කෙරෙන ලියවිලිවලත් "ගෙවන ලදී" මුද්‍රාව ගෙවූ දිනය සමඟ ගෙවන ලද නිලධාරියාගේ අත්සන හෝ කෙටි අත්සන සමඟ යෙදිය යුතු වුවත් මුද්‍රණාලයට ලබා දුන් රු.5,000,000 ක මුදලින් සිදු කල මිලදී ගැනීම් සඳහා ලබාදුන් කිසිදු ඉන්වොයිසියක එවන් මුද්‍රාවක් මුද්‍රණාලය විසින් තබා නොතිබුණි.	සියලුම මුද්‍රණ කටයුතු සඳහා වන වවුචර් මුද්‍රණාල නිලධාරි අණදෙනගේ නිර් දේශයෙන් හා උපකුලපතිගේ අනුමැතියෙන් පසුව එම අමුද්‍රව්‍ය වටිනාකමට සරිලන චෙක්පතක් මුදල් කර මෙහෙයුම් කලමනාකරු වෙත මුදල් ලබාදී ඇවැසි අමුද්‍රව්‍ය හා සේවාවන් මිලදී ගැනීම සිදුකර ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් නිලධාරියා ගේ අත්සන් සහ " ගෙවන ලදී" මුද්‍රාව යෙදිය යුතුය.
(vii)	මුදල් රෙගුලාසි 386 (3)	ලියනු ලබන සෑම චෙක්පතකම උප පත්‍රිකාවේ වවුචර අංකය සඳහන් කළ යුතු වුවත් මුද්‍රණාලයේ එසේ සිදු කර නොතිබුණි.	සියලුම මුද්‍රණ කටයුතු සඳහා වන වවුචර් මුද්‍රණාල නිලධාරි අණදෙනගේ නිර්දේශයෙන් හා උපකුලපතිගේ අනුමැතියෙන් පසුව චෙක්පතක් මුදල් කර මෙහෙයුම් කලමනාකරු වෙත මුදල් ලබාදී ගෙවීම් කර ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව උප පත්‍රිකාවේ සටහන් තැබිය යුතුය.
(viii)	මුදල් රෙගුලාසි 136,137,138 සහ 140	වියදම් සඳහා මුදල් රෙගුලාසි 136 ප්‍රකාරව බලය දීම, මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව අනුමත කිරීම, මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව වවුචරවලට මුදල් ගෙවීම සහ මුදල් රෙගුලාසි 140 ප්‍රකාරව ගෙවීම් වවුචර සම්මත කිරීම යන මුදල් රෙගුලාසීන් මුද්‍රණාලය විසින් අනුගමන කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.	සියලුම මුද්‍රණ කටයුතු සඳහා වන වවුචර් මුද්‍රණාල නිලධාරි අණදෙනගේ නිර්දේශයෙන් හා උපකුලපතිගේ අනුමැතියෙන් පසුව ගෙවීම් සිදුකර ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(ඇ)	**2024 පෙබරවාරි 28** දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක **01/2024** හි **11.4** වගන්තිය	නිල වාහනයක් ලැබීමට සුදුසුකම් ලද නිලධාරියෙකු ඕනෑම සේවා නියුක්තියක් යටතේ රජයට අයත් ව්‍යාපාර කිහිපයක සේවය කලද, එම නිලධාරියා සඳහා එක් වාහනයක් පමණක් සැපයිය යුතුය. ඒ අනුව විගණනයට භාජනය කල 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ඉන්ධන සහ	වත්මනෙහි රෝහල් සංචිතයේ ඇති රථ වාහන කිසිවක් නිලධාරීන් වෙත තම පෞද්ගලික පරිභෝජනය සඳහා වෙන් කිරීමක් සිදු නොකරන අතර සියළු රථවාහන රෝහල් පොදු	චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව කටයුතු කිරීම පිළිබඳ

		රියදුරු සමඟ වාහන 3 ක් පිළිවෙලින් ප්‍රධාන ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක සහ අධ්‍යක්ෂ වෛද්‍ය නිලධාරී වෙත ලබාදී තිබියදී විශ්වවිද්‍යාල රෝහල විසින් ද වෙන්කල වාහන 03 ක් ඉහත නිලධාරීන්ට ලබා දීමට කටයුතු කර තිබීම හේතුවෙන් කුලී වියදම ලෙස රු.2,400,000 ක් සහ ඉන්ධන වියදම ලෙස රු.1,316,790 ක් ඉහත චක්‍රලේඛයට පටහැනිව වැය කර තිබුණි.	අවශ්‍යතාවයන් සඳහා භාවිතා කරනු ලබයි.	විමර්ශනය ක් සිදුකළ යුතුය.
(ඇ)	**2022 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2020/01 මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5)**	අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුල අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත් අවස්ථා 13 කදී ලබා දී තිබූ රු.544,854 ක් වූ අත්තිකාරම් දින 12 ත් දින 718 ත් අතර කාලපරාසයකින්ද, අවස්ථා 12 කදී ලබා දී තිබූ රු.3,439,336 ක් වූ ගැනුම් අත්තිකාරම් දින 11 ත් දින 169 ත් අතර කාලපරාසයකින් ද යුතුව පියවා තිබූ අතර 2021 වර්ෂයේදී ලබා දී තිබූ රු.62,029 ක් වූ අත්තිකාරම දින 1,117 ක් ගත වී තිබුණ ද පියවා නොතිබුණි.තවද, ඉහත චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(අ) වගන්තිය අනුව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමය දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි අතර 2024 ජුනි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපිය මඟින් විශේෂිත අවස්ථා 03 කදී පමණක් තත්කාලීන අත්තිකාරම් මුදල වැඩි කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. ඉහත විශේෂ අවස්ථා තුනට අයත් නොවන කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 54 කදී රු.100,000 ඉක්මවා එකතුව රු.21,384,590 ක අත්තිකාරම් ලබාදීමට කටයුතු කර තිබුණි.	වෛද්‍ය පීඨයේ සහ සම සෞඛ්‍ය පීඨයේ විභාග කටයුතු වලදී බාහිර වෛද්‍යවරුන් හා අනෙකුත් විශේෂඥයින් විභාග සුපරීක්ෂණය සඳහා පැමිණේ. මෙවැනි සංකීර්ණ කාර්යයන් සිදු කිරීමට අත්‍යාවශ්‍ය වියදම් දැරීමට ඒ සඳහා පෙර සැලසුම් කල හා අනුමත කල අයවැයකට අනුව රු.100,000/- කට වඩා වැඩි වටිනාකමකින් යුත් අතුරු අග්‍රිමයක් ලබා දීම සිදු වේ. එකී අතුරු අග්‍රිමයන් විභාග කටයුතු අවසන් වූ වහාම අදාළ නිලධාරීන් විසින් පියවා දමන අතර ලබා ගත් අත්තිකාරම් මුදලින් අත ඉතිරි මුදලක් වෙතොත් නැවත විශ්වවිද්‍යාල ගිණුමෙහි තැන්පත් කරනු ලැබේ.	මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලය තුල අතුරු අග්‍රිම පියවීමටත් රු.100,000 සීමාව නොඉක්මවී මටත් වගබලා ගත යුතුය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.7,350,567,251 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 4,682,837,905 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,667,729,346 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ පුනරාවර්තන දායකය රු.2,046,133,569 කින් අඩු වීම, පොළී ආදායම් රු.626,588,234 කින් අඩුවීම හා රෝහලේ වියදම රු.425,579,269 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම ඉකුත් වසරට සාපේක්ෂව සියයට 18.44 කින් එනම් රු.1,871,823,682 කින් පහළ ගොස් තිබූ අතර ඒ සඳහා විදේශ ව්‍යවහාර මුදලින් පවත්වාගෙන ගොස් තිබූ ස්ථාවර තැන්පතු ආයෝජන ඉවත්කර ගැනීම හේතුවෙන් පොළී ආදායම අඩු වීම හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 8.65 කින් එනම් රු.740,446,454 කින් ඉහළ ගොස් තිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව කාර්යමණ්ඩල වැටුප් හා දීමනා, නඩත්තු වියදම් සහ රෝහල් වියදම් ඉහළ යාම මෙයට හේතු වී තිබූ අතර එම වැඩිවීම පිළිවෙලින් සියයට 21 ක්, 27 ක් සහ 35 ක් බැගින් විය. කාර්යමණ්ඩල වැටුප් හා දීමනා අතුරින් වැටුප් හා වේතන සියයට 14 කින් එනම්, රු.259,532,469 කින්, පර්යේෂණ දීමනා සියයට 67 කින් එනම්, රු.42,095,761 කින්, නඩත්තු වියදම් තුල පරිගණක, උපකරණ හා ගෘහභාණ්ඩ නඩත්තු වියදම් සියයට 43 කින්, එනම්, රු. 80,430,034 කින් සහ රෝහලේ මහජන අංශයේ වියදම සියයට 45 කින්, එනම්, රු. 345,422,727 කින් වැඩි වී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂයේ සියයට (-11.01) ක් වූ ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට (-19.41) ක් දක්වා පහත වැටී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ 0.91:1 ක් වූ ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 0.48:1 ක් දක්වා පිරිහී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී ස්කන්ධය මත ණය අනුපාතය 0.73:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 0.85:1 ක් දක්වා වැඩි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විශ්වවිද්‍යාල රෝහල තුළ 2024 වර්ෂය අවසානයේ රු.16,441,056 ක් වටිනා ඖෂධ හා එන්නත් ඒකක 363,012 ක් කල් ඉකුත් වී තිබූ අතර, එම ඖෂධ කල් ඉකුත් වීමෙන් පසුව ගබඩා හා රෝහලේ විවිධ අංශ තුල වර්ෂ 1 ත් 6 ත් අතර කාල පරාසයක සිට පැවතුණි.	රෝහල ආරම්භයේදී කොපමණ රෝගීන් ප්‍රමාණයක් ප්‍රතිකාර කිරීමට පැමිණේද යන්න තීරණය කිරීමට නොහැකි වීම සහ ඖෂධ තොග මෘදුකාංගයේ පහසුකම නොලැබීම හේතුවෙන් ඖෂධ සහ එන්නත් හුවමාරු කිරීමට නොහැකි වීම.	ඖෂධ තොග කළමනාකරණය නිවැරදිව සිදු කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම.
(ආ)	කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් හෙක්ටයාර් 21.5815 ක භූමියේ විශ්වවිද්‍යාලයීය ශික්ෂණ රෝහල ආරම්භකර තිබුණි. එහි ඉදිකර ඇති රෝහල් ගොඩනැගිලිවල වටිනාකම රු.45,385,484,229 ක් වූ අතර, භූමිය සංවර්ධනය වෙනුවෙන් රු.1,216,884,293 ක පිරිවැයක්ද දරා තිබුණි. ඉදිකිරීම් අවසන්කර වර්ෂ 08	මෙම ඉඩමේ හිමිකාරිත්වය මේ වන විට සීමාසහිත ප්‍රොවිඩන්ට් ප්‍රොපර්ටි ලංකා සමාගම සතු අතර පවරා ගැනීම් කටයුතු සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත, ආරක්ෂක අමාත්‍යාංශය වෙත හා ප්‍රාදේශීය ලේකම් කැස්බෑව වෙත අවශ්‍ය කටයුතු සඳහා ලිපි මගින් ඉල්ලුම් කර ඇත. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල ශික්ෂණ රෝහල වෙත	අදාල රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය සිදුකර රෝහල පිහිටි ඉඩම කඩිනමින් පවරා ගැනීමේ කටයුතු අවසන් කළ යුතු වීම.

	කට අධික කාලයක් ගතවී ඇතත් අදාල ඉඩම පවරාගැනීම අවසන්ව නොතිබුණි.	ඉඩම පවරා ගැනීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී වසර දෙකකට අධික කාලයක් ගත වී ඇතත් මේ සම්බන්ධව ක්‍රියා කර නොමැත. ආරක්ෂක අමත්‍යාංශයේ උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදුකිරීම කළයුතුව ඇති බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.	
(ඇ)	2021 අප්‍රේල් 20 දිනැති අංක අමප/21/0584/303/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මිලෝදා මූල්‍ය අධ්‍යයන ආයතනය විශ්වවිද්‍යාලයට පැවරීමේදී එම ආයතනය සඳහා සුදුසු සේවක සංඛ්‍යාව තීරණය කිරීමටත් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටත් අනුමැතිය ලබාදී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සේවක සංඛ්‍යාව අනුමතකර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.	සේවක මණ්ඩල අනුමැතිය සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට ඇත.	සුදුසු සේවක සංඛ්‍යාව කඩිනමින් අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඈ)	1988 අංක 27 හා 2007 අංක 50 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 68 දරණ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත ප්‍රකාරව 2011 වර්ෂයේ සිට කැඩෙට් නිළධරයන් හෝ රජයේ නිළධරයන් නොවන දේශීය හා විදේශිය සිසුන් මුදල් ගෙවීමේ පදනම මත උපාධි පිරිනැමීමට ඇතුළත්කර තිබුණි.2018 මාර්තු 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ශිෂ්‍යයන් බඳවාගැනිම සහ පාලක මණ්ඩලයේ තීරණ වලංගුතාවය යන කරුණු ආවරණය වන ලෙස විශ්වවිද්‍යාලයට ගැලපෙන ලෙස පනත සංශෝධනය කරගන්නා ලෙස දැනුම් දී තිබුණද සමාලෝචිත වර්ෂය තුලදීද පනත සංශෝධන කාර්යය අවසන්කර නොතිබුණි.	පනත් කෙටුම්පත සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් ව්‍යස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් 2024.06.27 දින ඉල්ලීම් කරන ලදී. පනත් කෙටුම්පත සමඟ ඉදිරියට යාම සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් නව අනුමැතියක් ලබා ගන්නා ලෙස ඉල්ලා නීති කෙටුම්පත් සම්පාදක විසින් 2024.11.28 දින ලිපියක් මෙම විශ්වවිද්‍යාලය වෙත යොමු කර ඇත. ඒ සම්බන්ධව උපදෙස් විමසා ආරක්ෂක අමාත්‍යාංශය වෙත 2024.12.11 දින ලිපියක් යොමු කර ඇත.	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශ පරිදි කඩිනමින් පනත සංශෝධනය කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම.
(ඉ)	2022 මැයි 09 දිනැති ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමේ ලිපිය මගින් SAGE 300 ERP Solution පරිගණක මෘදුකාංගය 2022 ජුනි 25 දිනට හෝ	වැටුප් පිළියෙල කිරීමේ මොඩියුලය (Payroll Module) නිසි පරිදි ස්ථාපිත කර පසුගිය මාස කිහිපය තුළ පැරණි වැටුප් පිළියෙල කිරීමේ මොඩලය හා	ප්‍රසම්පාදනයේදී හඳුනාගත් සියළු කාර්යයන් සඳහා මෘදුකාංගය ස්ථාපිත

	ඊට පෙර ස්ථාපිත කල යුතු බව දක්වා ඇතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වැටුප් පිළියෙල කිරීමේ මොඩියුලය ස්ථාපිත කර ඇති නමුත් එය ක්‍රියාකාරී මට්ටමෙන් නොපැවතුණි.	නව මොඩලය සමාන්තරව ක්‍රියාත්මක කර ගෙන යන ලදී. එසේ වුවත් 2025 අප්‍රේල් මාසයේ දී රජය විසින් සිදු කරනු ලබන වැටුප් සංශෝධන නිසා නැවත වරක් වැටුප් මොඩියුලයට සංශෝධන කිහිපයක් සිදු කිරීමට සිදු වී ඇත.	කර භාවිතා කළ යුතු වීම.

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2018 වර්ෂයේදී විශ්වවිද්‍යාල රෝහලේ රසායනාගාර පරීක්ෂණ ද්‍රව්‍යයන් හා වාර්තාවන් ප්‍රවාහනය කිරීමේ අරමුණින් රු.96,846,900 (ඇ.ඩො.530,000) ක් වැය කර අංශ (Stations) 56 ක් සම්බන්ධ කරමින් වායු නල පද්ධතියක් ස්ථාපනය කර තිබූ අතර, ඉන් අංශ 52 ක් සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේ ගමන්වාර සිදු කර තිබුණු අතර විගණිත දින වන විට අංශ 20 ක් ක්‍රියාත්මක නොවී තිබිණි. තවද සමාලෝචිත වර්ෂය තුළදී මෙම පද්ධතිය හරහා ගමන්වාර 43,307 ක් සිදු කර තිබූ අතර 2023 වර්ෂයේ සිදු කර තිබූ ගමන්වාර 70,217 ට සාපේක්ෂව සියයට 38 ක අඩුවීමක් දක්නට ලැබුණි.	මෙම පද්ධතියේ එළඹ තිබූ සේවා ගිවිසුම 2023 අප්‍රේල් මස 21 දින අවසන් විය. ඒ වන විටද අංශ (Station) 56 න් අංශ (Station) 04 ක් අක්‍රීය තත්වයේ පැවති අතර සේවා ගිවිසුම් සඳහා ඇ.ඩො. 17,490 ක මුදලක් වියදම් වී ඇත. සේවා ගිවිසුම් සඳහා ඉහල පිරිවැයක් දැරීමට රෝහල සතුව මුදල් නොමැති හෙයින් 2024 නොවැම්බර් මස 07 වන දිනැති විගණන සහ කළමණාකරණ කමිටු රැස්වීමේදී එම පද්ධතියේ ආයුකාලය අවසන් වන තෙක් භාවිතා කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කර ඇත.	විශාල පිරිවැයක් දරා ස්ථාපිත කර ඇති වායු නළ පද්ධතිය උපරිම ධාරිතාවයෙන් රෝහල් කටයුතු සඳහා භාවිතයට ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වීම.
(ආ)	රෝහලේ වාට්ටු අංක 5A, 7A හා 7B සහ දැඩි සත්කාර ඒකක 02, 03 හා 04 යන අංශ 2022 මැයි මස සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා උපයෝජනයෙන් තොරව පැවති අතර, ඒ තුල පැවති රු.210,190,808 ක් වටිනා වෛද්‍ය උපකරණද නිශ්කාර්යව පැවතුණි.	වාට්ටු අංක 7A, සහ 7B යන අංශ සහ වෛද්‍ය උපකරණ ද ක්‍රියාත්මක තත්වයේ පවතී. ප්‍රමාණවත් තරම් මානව සම්පත් නොමැති වීම නිසා රෝහලේ ඇතැම් වෛද්‍ය උපකරණ සහ භාණ්ඩ ක්‍රියාත්මක මට්ටමේ නොපවතී. රජය විසින් බඳවා ගැනීම් සීමා කර ඇති අතර, අවශ්‍ය මානව සම්පත් ලැබුණු විගස අදාළ වෛද්‍ය උපකරණ භාවිතයට ගනු ලබයි.	රෝහලේ සියළු වාට්ටු සහ වෛද්‍ය උපකරණ පූර්ණ ධාරිතායෙන් භාවිතා කිරීමට උපායමාර්ග සකස්කර ක්‍රියාත්මක කලයුතු වීම.

(ඇ)	2025 මාර්තු 31 දින වන විට වගකීම් කාලය ඉක්ම වූ රු.13,992,414 ක් වටිනා වෛද්‍ය උපකරණ අයිතම 14 කට අයත් 136 ක් ගබඩා තුළ නිශ්කාර්යව පැවති අතර එම අයිතම 2018, 2019, 2021 වර්ෂයන්වලදී ගබඩාවට ලැබී තිබුණි. හෘද උරස් ඒකකය සඳහා 2022 හා 2023 වර්ෂ වල මිලදී ගෙන තිබූ රු.186,506,145 ක් වටිනා වෛද්‍ය උපකරණ අයිතම 02 කින් ඒකක 05 ක් නිශ්කාර්යව ගබඩා කර තිබුණු අතර ඒ තුළ වූ රු.58,198,545 ක් වටිනා වෛද්‍ය උපකරණ අයිතමයකට අදාල ඒකක 03 ක වගකීම් කාලය ඉක්මවා ගොස් තිබුණි. 2017 වර්ෂයේ මිලදී ගන්නා ලද රෝහල් ඇඳන් 14 ක් භාවිතයට නොගෙන ගබඩා කර තිබුණි.	මෙම වෛද්‍ය උපකරණ Covid 19 කාල සීමාව තුලදී ආරම්භ කල වාට්ටු සඳහා නිකුත් කර තිබූ අතර රෝගය පහව යාමෙන් වාට්ටු වැසී ගිය බැවින් ආරක්‍ෂිතව තබා ගැනීම සඳහා නැවත මෙම ගබඩාව වෙත භාර දී ඇත. අළුත්වැඩියා කටයුතු සිදුකරන අවස්ථාවලදී සහ රෝහල තුල සිදුකරන වැඩමුළු වෙනුවෙන් මෙම උපකරණ නිකුත් කිරීම සිදුකරනු ලබයි. තවද මෙම වෛද්‍ය උපකරණ වලින් කොටසක් මල නොබැඳෙන වානේ වලින් සාදා ඇති අතර ඉදිරියේදී අවශ්‍යතාවය මත නිකුත් කිරීම සිදු කරයි.	නිශ්කාර්ය ලෙස පවතින වෛද්‍ය උපකරණ ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වීම.
(ඈ)	අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගැනීමකින් තොරව 2021 වර්ෂයේ දී මිලදී ගන්නා ලද රු.2,786,850 ක් වටිනා කම්බි 675 ක් දක්ෂිණ මණ්ඩපයේ ගබඩා තුල නිශ්කාර්යව පැවති අතර නිකුත් නොවී පවතින මෙම කම්බි තොග විශ්වවිද්‍යාලය විසින් ප්‍රයෝජනවත් ආර්ථික කටයුත්තකට යෙදවීමට කටයුතු කර නොතිබුණි.	විගණන නිරීක්ෂණ මත අවශ්‍ය මණ්ඩල පත්කොට මණ්ඩල නිර්දේශ මත පදනම්ව ඉදිරි කටයුතු කෙරේ.	නිශ්කාර්ය වත්කම් ප්‍රයෝජනවත් ආර්ථික කටයුත්තකට යෙදවීමට කටයුතු කළ යුතු වීම.

3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ඇමරිකානු ඩොලර් 1,300,334 ක් වැය කරමින් ස්ථාපිත කිරීමට සැලසුම්කල කළමනාකරණ තොරතුරු පද්ධතිය 2023 පෙබරවාරි 24 දින නිම කිරීමට නියමිතව තිබූ නමුත් අවස්ථා 03 කදී කාලය දීර්ඝ කිරීමෙන් පසු මෙම ව්‍යාපෘතිය 2025 ජනවාරි 22 අවසන් කළ යුතුව තිබුණි. නමුත් විගණිත දින වූ 2025 අප්‍රේල් 30 දින වන විටත් මෙම ව්‍යාපෘතියෙන් සියයට 90 ක ප්‍රමාණයක් පමණක් අවසන් කර තිබූ අතර ඒ වන විට වැය කර තිබූ මුදල ඇමරිකානු ඩොලර් 1,075,164.34 ක් විය.	ව්‍යාපෘතිය 2025 ජනවාරි 8 වන දින අවසන් කළ යුතුය. අවශ්‍යතා අනුව මෘදුකාංග වින්‍යාසය සහ අභිරුචිකරණය සම්පූර්ණ කර ඇතත්, පද්ධතිය අපේක්ෂා කළ පරිදි සජීවීව ක්‍රියාත්මක විය නොහැක. දෘඩාංග ස්ථාපනය 88.5% ක් ද ,මෘදුකාංග ස්ථාපනය 100% ක් ද,මෘදුකාංග අභිරුචිකරණය 85% ක් ද, සමස්ත ප්‍රගතිය 90% ක් ද ලෙස කාර්ය සම්පූර්ණ කර ඇත.	සැලසුම් කල පරිදි පද්ධතිය ස්ථාපිත කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 (ඇ) අනුව කිසිම රජයේ නියෝජ්‍යායතනයක් ස්වයංක්‍රීය ලෙස සෘජු කොන්ත්‍රාත් ක්‍රමය සඳහා සුදුසුකම් නොලබන අතර, ඒ සඳහා 3.5.1 (ඇ) යටතේ දක්වා ඇති අවශ්‍යතා සපුරාලිය යුතු වුවත් මුද්‍රණාලය විසින් රු. 4,676,475 ක මිලදී ගැනීම් සිදු කිරීමේදී සෘජු කොන්ත්‍රාත් ක්‍රමයට මිලට ගැනීම් සිදු කර තිබුණි. මිල සැඳහුම් ක්‍රමය භාවිතා කරමින් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම හෝ දුරකථන නාමාවලියෙහි ප්‍රසිද්ධ වෙළඳුන්ගෙන් මිල ගණන් කැඳවීම හෝ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව සිදු කර නොතිබුණි. තවද, මිලදී ගැනීම් සඳහා නිශ්චිත තාක්ෂණික පිරිවිතර සැකසීමක් ද මුද්‍රණාලය විසින් සිදුකර නොතිබුණි.	ඉදිරියේදි ටෙන්ඩර් පටිපාටිය අනුව කටයුතු කිරීමට උපදෙස් දී ඇත.	ප්‍රසම්පාදන මාර්ගගෝපදේශ ප්‍රකාරව මිළ ගණන් කැඳවීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	රු.17,493,620 ක මුදලකට එයාර් ෆ්ලෝ මීටර් 50 ක්, හයි සක්ෂන් කන්ට්‍රෝලර් ඒකක 440 ක් සහ ලෝ සක්ෂන් කන්ට්‍රෝලර් ඒකක 07 ක් මිලදී ගැනීමට විශ්වවිද්‍යාලය විසින් පුද්ගලික ආයතනයක් සමඟ 2018 මැයි 18 දින ගිවිසුමකට එළඹ තිබූ අතර 2019 වර්ෂයේදී ණයවර ලිපි විවෘත කර රු.9,160,362 ක් අදාළ ආයතනයට ගෙවා තිබුණි. මෙම උපකරණ නියමිත පරිදි රෝහලේ ගබඩා වෙත ලැබුණු බව සනාථ කර ගැනීමට භාණ්ඩ භාර ගැනීමේ පත්‍රිකා හෝ එහි පිටපත් අදාළ ගබඩාවේ හෝ KDU/PRO/CAP/1251/2017 අංක දරන ලිපි ගොනුවට හෝ ඇතුලත් කර නොතිබුණි. 2025 මැයි 02 දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණ අනුව ඉහත උපකරණ කිසිදු ප්‍රයෝජනයක් නොගෙන වසර 5 කට ආසන්න කාලයක සිට රෝහල් ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි. 2024 අගෝස්තු 14 දිනැති අංක විවිරෝ/කොආවි/වෛද්‍ය/උඅ/04/2024(13) දරන ලිපිය අනුව ඉහත උපකරණවල තත්ත්ව පරීක්ෂණය සිදුකර දෙන ලෙස ගබඩාව විසින් 2023 ඔක්තොම්බර් 18 දින වෛද්‍ය ප්‍රසම්පාදන කාර්යාලය දැනුවත් කර තිබුණ ද 2025 මැයි 02 වන විටත් අදාළ තත්ත්ව පරීක්ෂා සිදු කර නොතිබුණි.	මෙම වෛද්‍ය අයිතම තොගය සබැඳි ප්‍රසම්පාදන ලිපි ගොනුව විශ්වවිද්‍යාලයීය රෝහල ආරම්භ කිරීමට ප්‍රථම විවෘත කර ඇති නමුදු එම වෛද්‍ය අයිතම තොගය ඉල්ලුම් කිරීමේ අවශ්‍යතාවයන් පිළිබඳව හා අවසන් පරිශීලක (END USER) සම්බන්ධව කිසිදු පැහැදිලි සටහනක් නොමැත. ප්‍රමාණවත් මානව සම්පත් නොමැති වීම නිසා රෝහලේ දැඩිසත්කාර ඒකක සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක මට්ටමේ නොපවතින අතර වෛද්‍ය අයිතමයන්ගේ අවශ්‍යතාවයක් ඇති වී නොමැත. ගබඩාව වෙත ලද තොගය තත්ව පරීක්ෂාව අසමත් වී ඇත. නැවත එම භාණ්ඩ ඉල්ලුම් කර තත්ව පරීක්ෂා සිදු කර වාර්තාව ඉදිරිපත් කරමි.	මෙම නිශ්කාර්ය හා තත්ව පරීක්ෂාව අසමත් වෛද්‍ය උපකරණ මිලදී ගැනීම හා උපයෝජනය නොවීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකළ යුතු වීම.

(ඇ)	විශ්වවිද්‍යාල ශ්‍රවනාගාරය සඳහා රු.84,848,400 ක වටිනාකමකින් යුතු පුටු 1,275 ක් මිලදී ගැනීමට 2023 මාර්තු 10 දින අත්සන් කරන ලද ගිවිසුම අනුව එම පුටු 2023 නොවැම්බර් 14 දින විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබුණි. මේ වන තෙක් ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් එම ඉදිකෙරෙමින් පවතින ශ්‍රවණාගාර ගොඩනැගිල්ල තුල නිශ්කාර්යව පැවති අතර වසරක් වූ වගකීම් කාලය ද ඉක්මවා තිබුණි.	2023 ජුනි 07 දින ආයතනය වෙත ලැබී තිබුණද විශ්වවිද්‍යාල ශ්‍රවණාගාර ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු තවමත් අවසන් වී නොමැති බැවින් මෙකී පුටු ශ්‍රවණාගාරය තුළ සවි කර නැත. මිලදී ගැනුම් කොන්ත්‍රාත්තුවේ සැපයුම්කරු විසින් අදාළ භාණ්ඩ සැපයීමට සහ සවි කිරීමට ගිවිසුම් ගත වී ඇත.	කඩිනමින් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම.